"විශිෂ්ඨ රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු"

ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත

பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்

OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE

204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary
දුරකථන / தொலைபேசி / Telephone - 011 - 2092599
ෆැක්ස් / பெக்ஸ் / Fax - 011 - 2092601
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail - chiefsecretary@wpc.gov.lk
පොදු දුරකථන / தொலைபேசி இலக்கம் / General Telephone 011 - 2093000

ISO 9001 SLSL SYSTEM CERTIFIED

SLAB ACCREDITED ISO/IEC: 17021 QMS-001-01

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය / எனது இலக்கம் / My No. | CSWP/ADM/IT-05/53/FI/07 | ඔබේ අංකය / உமது இலக்கம் / Your No. | | දිනය / திகதி / Date | 2019/07/31 |

**<u>පාලන චක්‍රලේඛ 07 /2019</u>**

ආණ්ඩුකාර ලේකම් (බ.ප),
ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප.),
සභා ලේකම් (බ.ප),
සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් (බ.ප.),
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන/ පිරිස් පුහුණු/ මූල්‍ය/ සැලසුම්/ ඉංජිනේරු),
සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
ප්‍රධාන අභ්‍යන්තර විගණක (අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව - බ.ප.)
ව්‍යවස්ථාපිත ආයතන ප්‍රධානීන්,
ප්‍රාදේශීය කාර්යාල ප්‍රධානීන්,
පළාත් පාලන ආයතන ප්‍රධානීන්,

**<u>බස්නාහිර පළාත් සභාවට අයත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන, ප්‍රාදේශීය කාර්යාල සහ පළාත් පාලන ආයතන සතු වෙබ් අඩවි අතුරින් හොඳම වෙබ් අඩවිය තේරීමේ තරගය - 2019</u>**

බස්නාහිර පළාත් සභාවට පැවරී ඇති විෂයයන්ට අදාල කාර්යයන් ඉටුකිරීම සඳහා වූ තොරතුරු හා දත්ත විධිමත්ව කාර්යක්ෂමව හා ඵලදායී ලෙස යොදා ගනිමින් තොරතුරු තාක්ෂණ සංවර්ධනයේ ප්‍රතිලාභ ජනතාව වෙත ලබා දීම දිරිගැන්වීමේ අරමුණින් බස්නාහිර පළාත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන, ප්‍රාදේශීය කාර්යාල හා පළාත් පාලන ආයතනවල වෙබ් අඩවි පරික්ෂා කර බලා යාවත්කාලීන කිරීම් නිසි පරිදි සිදුකර පවත්වාගෙන යනු ලබන ආයතන තෝරා සම්මාන ප්‍රදානය කිරීමට තීරණය කර ඇත.

02. ඒ අනුව බස්නාහිර පළාත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන, ප්‍රාදේශීය කාර්යාල හා පළාත් පාලන ආයතනවල වෙබ් අඩවි සියල්ලෙහි අන්තර්ගත තොරතුරු යාවත්කාලීනබව සහ නිරවද්‍යතාව අනුව තෝරා ගැනීම සිදුකරන අතර ඒ සඳහා අවශ්‍ය සුදුසුකම්, පාදක කරගන්නා නිර්ණායක හා යෝජිත ලකුණු ලබා දීමේ ක්‍රමවේදය පහත දක්වා ඇත.

| | | නිර්ණායක | උපරිම ලකුණු |
|---|---|---|---|
| **1** | **සම්පූර්ණ බව/ ත්‍රෛභාෂා පහසුකම (10 ලකුණු)** | | **10** |
| | 1.1 | සියලු වෙබ් පිටුවල අන්තර්ගතය සම්පූර්ණ බව | 02 |
| | 1.2 | වෙබ් අඩවිය යාවත්කාලීන කර ඇති බව | 02 |
| | 1.3 | බිහිදොර පිටුවේ සිංහල, දෙමළ, ඉංග්‍රීසි යන කුමන හෝ භාෂා මාධ්‍යයක් තෝරා ගැනීමේ පහසුකම පැවතීම | 02 |
| | 1.4 | සියලු වෙබ් පිටු ත්‍රෛභාෂා පහසුකම සහිතව පැවතීම | 02 |
| | 1.5 | බාගත කිරීමේ පහසුකම (අයදුම්පත්, චක්‍රලේඛආදිය) භාෂා 03 සඳහාම පැවතීම | 02 |